ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය -PS/DSP/ENV/06/18

2018 මැයි මස 14 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම ප්‍රධාන ලේකම්වරුන්
සියළුම රාජ්‍ය ලේකම්වරුන්
සියළුම පළාත් ලේකම්වරුන්
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියළුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## <u>ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන - 2018 ජූනි 05</u>

ඈත අතීතයේ සිටම සොබාදහම හා මිනිසා අතර වෙන් කළ නොහැකි බැඳීමක් පැවතුණු අතර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වන පාරිසරික වෙනස්කම් සමස්ත ජීවීන්ගේ පැවැත්මට විශාල තර්ජනයක් වී ඇත. සීඝ්‍ර ජනගහන වර්ධනයත් සමඟ අසීමිත මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සීමිත සම්පත් අවිධිමත් ලෙස පරිභෝජනය කිරීම තුළින් ගෝලීය උෂ්ණත්වය ඉහළයාම, දේශගුණ විපර්යාස, හරිතාගාර ආවරණය, පාංශු හායනය, ජල මූලාශ්‍ර සිඳීයාම ආදී පාරිසරික ගැටලු රැසක් උද්ගත වී ඇත. එබැවින් මිනිසාගේ සහ අනෙකුත් ජීවීන්ගේ යහපැවැත්ම උදෙසා සොබාදහම සමඟ වූ සබැඳියාව තිරසර ලෙස පවත්වා ගැනීම සඳහා පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව මේ වන විට ලොව පුරා සියළු රටවල ජනතාවගේ විශේෂ අවධානය යොමු වී ඇත.

02. මෙම තත්ත්වය පිළිබඳව ලෝක ප්‍රජාවගේ අවධානය යොමු කිරීමේ අදිටනින් 1972 වර්ෂයේ දී ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවරදී පැවති ජාත්‍යන්තර පරිසර සමුළුවෙහිදී ගන්නා ලද තීරණයකට අනුව බිහි වූ **එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ** (UNEP) සමාරම්භක දිනය සැමරීම උදෙසා, සෑම වසරකම **ජූනි 05 ජගත් පරිසර දිනය** වශයෙන් නම් කර ඇත. පරිසර සංරක්ෂණය පිළිබඳව ලෝකවාසී ජනතාව දැනුවත් කිරීමට හා පාරිසරික ගැටළු පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කිරීමේ අරමුණින්, එක් එක් වර්ෂයන්හිදී විශේෂිත තේමා යටතේ ජගත් පරිසර දිනය සමරනු ලබයි. එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් මෙම වසරේ ජගත් පරිසර දින තේමාව ලෙස **"Beat Plastic Pollution"** යන්න ඉදිරිපත් කර ඇත. ඒ අනුව **"ප්ලාස්ටික් අවභාවිතාව මගින් සිදුවන පරිසර දූෂණය පිටු දකිමු"** යන තේමාව යටතේ අප රට ද මෙම වසරේ ජගත් පරිසර දිනය සමරනු ලැබේ.

03. "ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන" යන මැයෙන් යුතුව 2016 අප්‍රේල් 28 දින අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ජගත් පරිසර දින ජාතික උත්සවයට සමගාමීව **"ජාතික පරිසර සතියක්"** ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව මෙම වර්ෂයේ ද මැයි 30 සිට ජූනි 05 දක්වා සතිය "ජාතික පරිසර සතිය" ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර එම දිනයන් පහත පරිදි නම් කර ඇත.

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

මැයි 30 පරිසරය පවිත්‍ර කිරීමේ දිනය හා පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ දිනය
මැයි 31 කසළ කළමනාකරණ දිනය
ජුනි 01 රුක් රෝපණ දිනය
ජුනි 02 ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය
ජුනි 03 ජෛව විවිධත්වය සංරක්ෂණ දිනය
ජුනි 04 තිරසර ඉඩම් කළමනාකරණ දිනය
ජුනි 05 ජගත් පරිසර දිනය

04. ඒ අනුව සියළුම ආයතන ප්‍රධානීන් විසින් තම කාර්ය මණ්ඩලය ද, විදුහල්පතිවරුන් විසින් තම විදුහලේ ගුරුභවතුන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද ජගත් පරිසර දිනයේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම, කාර්යාල හා පාසල් පරිශ්‍ර පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන පැවැත්වීම, කසළ වර්ගීකරණය කර (ප්ලාස්ටික්/ පොලිතීන් / කඩදාසි / වීදුරු / ලෝහ / කාබනික ද්‍රව්‍ය ලෙස) විධිමත් අයුරින් බැහැර කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමෙන් එම කටයුතු පවත්වාගෙන යාම සහ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ.

05. එසේම දිවයින පුරා පළාත් පාලන ආයතනවල මූලිකත්වයෙන් එම පළාත් පාලන බල ප්‍රදේශ තුළ, පරිසරය පවිත්‍ර කිරීම, කසළ වර්ගීකරණය හා කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර පවත්වා ගෙන යාම ඇතුළු පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ.

06. තවද ජාතික පරිසර සතිය තුළදී රාජ්‍ය ආයතන, පාසල්, පෞද්ගලික අංශය, වැවිලි සමාගම් හා වතු ක්ෂේත්‍රය, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සංවිධානවල මූලිකත්වයෙන් ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

i. ලස්සන, පවිත්‍ර රටක් නිර්මාණය කිරීම එක් එක් නිවසින් ආරම්භ කිරීමේ වැදගත්කම සහ පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම
ii. වස විස නැති කාබනික ගොවිතැන හා තිරසර ගෙවතු වගා ප්‍රවර්ධනය කිරීම
iii. ප්‍රදේශයට අනුව හරිත රැකියා හඳුනා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
iv. පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සහ පරිසර හිතකාමී ඇසුරුම් ප්‍රවර්ධනය
v. විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කිරීම
vi. වන ආවරණය ඉහළ නැංවීමට ක්‍රියාකිරීම හා ග්‍රාමීය මට්ටමින් සහ ආයතන මට්ටමින් රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම සඳහා පැළ තවාන් ඇති කිරීම
vii. ජලපෝෂක, රක්ෂිත ප්‍රදේශ, ගංගා ඉවුරු, තෙත් බිම් ප්‍රදේශ වැනි පරිසර සංවේදී භූමි හඳුනා ගැනීම හා ඒවා සංරක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
viii. හානියට පත් භූමි පුනරුත්ථාපනය, පාංශු සංරක්ෂණය හා තිරසර ඉඩම් කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
ix. ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා කටයුතු කිරීම
x. හරිත වෙරළ සංකල්පයට අනුව වෙරළ තීරයේ තුරු ආවරණය වැඩිදියුණු කිරීම හා වෙරළ කලාප පවිත්‍ර කිරීම
xi. වෙරළ පරිසර පද්ධති තිරසර කළමනාකරණය හා කඩොලාන සංරක්ෂණයට ක්‍රියාමාර්ග ගැනීම

07. සෑම ආයතනයක් විසින්ම ඉහත යෝජිත පරිදි සුදුසු පරිසර සංරක්ෂණ වැඩසටහන් ජාතික පරිසර සතිය තුළදී ඉටුකිරීම සඳහා පූර්ව සැලසුම් සකස් කර දේශපාලන නායකත්වයේ ද සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීම සුදුසු බව වැඩිදුරටත් දන්වමි.

08. ජාතික පරිසර සතිය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ට පිටපතක් සහිතව ජනාධිපති කාර්යාලයේ "පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන" වෙත වාර්තා කළ යුතුය. එසේම ඉදිරි වර්ෂයන්හිදී ජාතික පරිසර සතිය ක්‍රියාත්මක කිරීම සහතික කරනු වස් එම වැඩසටහන් තම ආයතනවල, දිස්ත්‍රික්කවල හෝ පළාත්වල වාර්ෂික සැලසුම්වලට ඇතුළත් කර ගැනීමට ක්‍රියා කරන මෙන් ද කාරුණිකව දන්වා සිටිමි.

09. පරිසර සංවේදී ප්‍රජාවක් බිහිකිරීම සඳහා ඔබ දක්වන සහයෝගය අතිශයින් අගය කරමි.

ඔස්ටින් ප්‍රනාන්දු
ජනාධිපති ලේකම්

පිටපත්

01. අග්‍රාමාත්‍ය ලේකම් - කරු.දැ.ගැ.ස.
02. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු.දැ.ගැ.ස.